ලියන ලද්දේ Museum Department
2012 මාර්තු 12 වෙනි සදුදා, 05:36 - අවසන් යාවත්කාලීන කිරීම 2012 ඔක්තෝබර් 09 වෙනි අඟහරුවාදා, 08:17



## "ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය" පිළිබඳ ප්‍රදර්ශන මැදිරිය..............................

"ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය" පිළිබඳ ප්‍රදර්ශන මැදිරිය කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ගේ ප්‍රධානත්වයෙන් සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2012 මාර්තු මස 09 වැනිදා කොළඹ ජාතික කෞතුකාගාරයේදී මහජනතාව උදෙසා විවෘත විය.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මයේ භාවිත උපකරණ, කෘෂිකර්මික ක්‍රම, පළිබෝධ පාලන ක්‍රම සහ ධාන්‍ය ඇසුරුම් ක්‍රම පිළිබඳව මෙම මැදිරිය සකස් කර තිබේ. පැරණි ගැමියා පරිසර හිතකාමී ලෙස තම කෘෂිකර්මික ක්‍රම සකස් කර ගත් අයුරු ඉන් පිළිබිඹු වේ.

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් කාන්ති විජේතුංග, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක, ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂ ආචාර්ය සරෝජා වෙත්තසිංහ, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය නිමල් සිල්වා හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විජය දිසානායක යන මහත්ම මහත්මීන් ද ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් මේ සඳහා සහභාගි විය.

{besps}/News/2012/March{/besps}